සැ.යු.- 2017.05.26 දින පළ වූ අංක 2021 දරන *ගැසට් පත්‍රයේ* II සහ III කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,022 - 2017 ජුනි මස 02 වැනි සිකුරාදා - 2017.06.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 930 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 934 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* -(i) ආනන්ද අලුත්ගමගේ සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 මැයි මස 26 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) විශේෂ තැන්පත් ගිණුම පනත් කෙටුම්පත 2017 මැයි මස 26 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ඉලෙක්ට්‍රොනික ගනුදෙනු (සංශෝධන) පනත් කෙටුම්පත 2017 මැයි මස 26 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 ජුනි මස 23 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 ජුනි මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## දඹුල්ල ප්‍රාදේශීය සභාව

දඹුල්ල ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති දඹුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත සඳහන් කරුණුවලට අදළ අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍ර අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර සම්පූර්ණ කර ලේකම්. දඹුල්ල ප්‍රාදේශීය සභාව යන ලිපිනයට 2017.07.01 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරු | 01 | රු. 24,550 - 10 x 250 - 10 x 270- 10 x 300 - 12 x 330 - රු. 36,410 ( 03/2016 PLI -2016) | 5 ශ්‍රේණිය සමත් විය යුතුය. |
| 02 | රියදුරු | 01 | රු. 25,025 - 10 x 270-300 x 10 - 330 x 10 -350 x 10 - රු. 38,450 PL2 -2016 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම, මින් විෂයන් 05ක් එක් වරකදී සමත්වී තිබිය යුතුය.<br><br>*වෘත්තීය සුදුසුකම් :*<br><br>තාරබර හොන්ඩර් 34ට වැඩි බර, මෝටර් වාහන බර, ටේලර් සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙනයා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම. (බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද "ඒ" වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "බී" පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.);<br><br>හා<br><br>ඉහත බලපත්‍රයට අතිරේකව තනතුරට අදළ වන යන්ත්‍ර ක්‍රියා කරවීම සම්බන්ධව රජයේ පිළිගත් ආයතනයකින් (NAITA/ICTAD) පුහුණුව ලැබූ බවට (NVQ4 මට්ටමට නොඅඩු) සනාථ කරන සහතිකය.<br><br>*කායික සුදුසුකම් :*<br><br>I. සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර, දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.<br><br>II. අවම උස අඩි 05 අඟල් 2 1/2 ක් විය යුතුය. |

03. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

i. අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද සඳහා විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම කරනු ලැබේ.

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු පුරුෂ/අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.
ii. තෝරාගනු ලබන්නේ අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වය. එම කාලය තුළදී වැඩ පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලැබේ.

06. *වෙනත් පොදු කොන්දේසි :*

i. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
ii. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික විය යුතුය.
iii. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
iv. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු අතර රජයේ/පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.
v. දඹුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 ක පදිංචිය සනාථ කිරීමට වසමේ ග්‍රාම නිලධාරීගේ සහතිකය ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර සනාථ කළ යුතුය.

07. *අයදුම්කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල පමණක් අයදුම්පත් 2017.07.01 වැනි දිනට හෝ එදිනට පෙර ලේකම්, දඹුල්ල ප්‍රාදේශීය සභාව, කිඹිස්ස යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් විය යුතුය.

ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතු වේ.

(දැනටමත් රාජ්‍ය, පළාත් රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.)

08. අයදුම් පත සමඟ පහත සඳහන් සහතිකවල ඡායාපිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික හා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළයුතුය.

i. උප්පැන්න සහතිකය
ii. අධ්‍යාපන සහතික
iii. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම නිලධාරි සහතිකයක්
iv. මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක් (එකක් ග්‍රාම නිලධාරිවරයාගෙන් විය යුතුය.)
v. වෘත්තීය පිළිබඳ සහතික තිබේනම් එම සහතිකය.
vi. සේවා සහතිකය (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට පමණි.)

09. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම් හෝ වෙනස් කිරීම් සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී බලතල දඹුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය. දෙමළ පරිවර්තනවල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතුය.

බී. එම්. එම්. බාලසූරිය,
ලේකම්,
දඹුල්ල ප්‍රාදේශීය සභාව,
සීගිරිය.

ආදර්ශ අයදුම්පත්‍රය

**දඹුල්ල ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කම්කරු/රියදුරු තනතුරු සඳහා බඳවා ගැනීම - 2017**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

(අදාළ කොටුව තුළ ලියන්න.)

1.0 අයදුම් කරනු ලබන තනතුරු නාමය :————————————.

2.0 මුලකුරු සමග නම (මුලකුරු අගට යොදා)ඃ (මයා/මිය/මෙනවිය)
සිංහලෙන්/දෙමළෙන් :————————————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :————————————.
(උදා ඃ PERERA A. B. C.)

2.1 සම්පූර්ණ නම :————————————.
සිංහලෙන්/දෙමළෙන් :————————————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :————————————.

3.0 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

4.0 ස්ත්‍රී/පුරුෂ භාවය (අදළ කොටුව තුළ ලියන්න.)

පුරුෂ - M
ස්ත්‍රී - F

5.0 *කාර්යාලයීය ලිපිනය* ඃ (පැහැදිලි අකුරෙන්) :
සිංහලෙන්/දෙමළෙන් :————————————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :————————————.
5.1 *පෞද්ගලික ලිපිනය* :
සිංහලෙන්/දෙමළෙන් :————————————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :————————————.

6.0 දුරකථන අංක ඃ ස්ථාවර :——————. ජංගම :————————.

7.0 *පදිංචිය* :

7.1 පදිංචි දිස්ත්‍රික්කය :————————————.
7.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————————————.

8.0 *විවාහක/අවිවාහක බව* :

අවිවාහක - 1 විවාහක - 2

9.0 උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

9.1 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට (2017.07.01) වැනි දිනට) වයස ඃ

අවුරුදු : මාස : දින :

10.0 *තනතුර* :

10.1 දැනට දරන තනතුර :————————————.
10.2 ස්ථිර තනතුරට පත් වූ දිනය :————————————.

11.0 *අධ්‍යාපන සුදුසුකම් :*

11.1 අ.පො.ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

11.2 අවසන් වරට සමත් ශ්‍රේණිය :
——————————————.
——————————————.

පළමුවන වර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :——————————.
(ii) විභාග අංකය :——————————.
(iii) ප්‍රතිඵල :——————————.

| *විෂය* | *ශ්‍රේණිය* | *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

11.2 අ.පො.ස (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර :
දෙවන වර

(i) විභාගයේ වර්ෂය හා මාසය :——————————.
(ii) විභාග අංකය :——————————.
(iii) ප්‍රතිඵල :——————————.

| *විෂය* | *ශ්‍රේණිය* | *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

12.0 *වෘත්තීය සුදුසුකම් :* රියදුරු බලපත්‍ර අංකය :.............................. පන්තිය නිකුත් කළ දිනය ...................

| *හදරා ඇති පාඨමාලාව පිරිනමනු ලැබූ ආයතනය* | *හදරන ලද කාල සීමාව* | *සහතික පත් අංකය හා වලංගු දිනය* |
|---|---|---|
| | | |

13.0 පළපුරුද්ද :——————————.

14.0 වෙනත් සුදුසුකම් :——————————.

15.0 *අයදුම්කරුගේ/අයදුම්කාරියගේ ප්‍රකාශය :*

..................................................... වන මම මෙහි සඳහන් කරන සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි ඇතුළත් කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත් සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි.

...................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————

16.0 *දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ /ආයතනයේ ....................................... තනතුරෙහි සේවය කරන ........................මහතාගේ/මහත්මියගේ/මෙනවියගේ වැඩ හැසිරීම සතුටුදායක වන බවත්, ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැකිය./නොහැකිය.

——————————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :——————

06-154

---

# පළාත් පාලන නිවේදන

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වගන්තියේ බලතල ප්‍රකාරව වාර වාර්තා කැඳවීම**

කෑගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, කෑගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වරිපනම් කාර්යය සඳහා යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපලක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා සහ හෝ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගා කළ ඉඩමක විශාලත්වය තක්සේරු කිරීම සඳහා එකී යම් දේපළක අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුළිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි විශාලත්වය පිළිබඳ වාර වාර්තා සපයා ඇති ආකෘති පත්‍රයට අනුව සපයන ලෙස එකී පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් නිවේදනය කරමි.

තව ද, ඉහත නිශ්චිතව සඳහන් කර ඇති දින හෝ එදිනට පෙර එම තොරතුරු/වාර වාර්තා සැපයීම පැහැර හරින හෝ නොසලකා හරින හෝ දැනුවත්ව අසත්‍ය හෝ සාවද්‍ය වාර වාර්තා සැපයීම කරන සෑම තැනැත්තෙකුම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියේ (3) වන උපවගන්තියට අනුව නිසි අධිකරණයේ වරදකරුවකු කරනු ලැබුවහොත් ප්‍රාදේශීය සභා පනතේ සඳහන් දඩයකට යටත් විය යුතු බවත් වැඩිදුරටත් දැනුම් දෙමි.

ආදර්ශ අයදුම්පත්‍ර මේ සමග පළ කරමි.

එස්. ඒ. එස්. එම්. වික්‍රමසූරිය,
ලේකම්,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

2017 මැයි මස 12 වැනි දින,
කෑගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛන අංකය 07

වාර වාර්තා ඉල්ලා යවන නිවේදනය

මගේ අංකය : කේ. පී. එස්. 1/4/7/2.
කෑගල්ල ප්‍රාදේශීය සභාව,
බුළුරුප්ප හෙට්ටිමුල්ල.
............ දින.

අයිතිකරු/පදිංචිකරු
.....................................
....................................

**දේපළවල වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමට/අක්කර බදු කාර්යය සඳහා දේපළ සනොක්ෂණය කිරීමට වාර වාර්තා**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල යටතේ එකී ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් මාවෙත ලැබී ඇති බලතල යටතේ කෑගල්ල ප්‍රාදේශීය සභාව විසින් 2016 ක් වූ අප්‍රේල් මස 05 වැනි දින, තීරණ අංක 4-39 යටතේ කෑගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති සෑම දේපළකටම අදාළව වාර වාර්තා ලබා ගැනීම කළ යුතු යැයි තීරණය කර ඇත.

02. ඒ අනුව මෙම නිවේදනය සමග අමුණා ඇති ආකෘතිය පිටපත් දෙකකින් යුක්තව සම්පූර්ණ කර පහත සඳහන් ලිපි ලේඛන ද සමග 20..............දින දහවල් 12.00 ට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාර දෙන ලෙස ඔබට මෙයින් නියම කරනු ලැබේ.

1. ඉඩමේ ඔප්පුවේ සහතික කරන ලද පිටපත් දෙකයි.
2. පසුගිය වසර 30ට අදළව අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කළ ඉඩමේ පත්තිරුවල මුල් පිටත සහ සැලැස්මේ සහතික කරන ලද ඡායා පිටපතක්
3. ඉඩමේ මිනින්දෝරු සැලැස්මේ සහතික කරන ලද පිටපත් දෙකයි. (මුල් පිටපතේ පරිමාණයටම ලබාගත් ඡායාපිටපත් දෙකක්.)
4. ඉඩම තුළ ගොඩනැගිලි ඇත්නම්, පරිමාණයට අඳින ලද ගොඩනැගිලි සැලසුම් පිටපත් දෙකක්. (නිවාස හා නගර සංවර්ධන ආඥාපනත හෝ නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ සාදන ලද "සැලසුම් හා ගොඩනැගිලි නියෝග" අනුව ඉදි කිරීම් බලපත්‍රයක් ලබාගෙන ඉදිකරන ලද ගොඩනැගිල්ලක් නම්, අදළ අනුමත කරන ලද ඡායා පිටපත් දෙකක් විය යුතුය.)
5. මේ සමග අමුණා ඇති ආකෘතියට සාරානුකූලව පිළියෙල කර නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද දේපළෙහි හිමිකම් වාර්තා පිටපත් දෙකක්.
6. ඉඩමෙහි හෝ ගොඩනැගිලි තුළ හෝ යන්ත්‍ර සූත්‍ර සවිකර ඇත්නම්, ඒ එක් එක් යන්ත්‍ර සූත්‍ර පිළිබඳ විස්තරය, මිලදී ගත් දිනය සහ වටිනාකම දක්වෙන ප්‍රකාශයක පිටපත් දෙකක් සහ මිලදී ගත් කුවිතාන්සිවල පිටපත් දෙක බැගින්.
7. ඉහත ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන්නේ අයිතිකරු විසින් නොව, වෙනත් තැනැත්තකු විසින් නම්, ඒ සඳහා ඔහුට බලය පවරන ලද ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රයේ සහතික කරන ලද පිටපත් දෙකක් සමග ඇටෝර්නි බලපත්‍රය මේ වන තෙක් ම අවලංගු කර නොමැති බවට සහ ඇටෝර්නි බලය පවරන ලද තැනැත්තා මේ වන තෙක්ම ජීවතුන් අතර සිටින බවට තහවුරු කරන ලද දිවුරුම් ප්‍රකාශ දෙකක්.

03. අමුණා ඇති ආකෘතිය සම්පූර්ණ කිරීමට පෙර උපදෙස් හොඳින් කියවන්න.

04. ඉහත නිශ්චිතව සඳහන් කර ඇති දින හෝ එදිනට පෙර මේ තොරතුරු සැපයීම පැහැර හැරීම හෝ අසත්‍ය හෝ සාවද්‍ය වාර වාර්තා සැපයීම කරන සෑම තැනැත්තෙකුම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියේ (3) වන උප වගන්තියට අනුව වරදක් කරනු ලබන්නේය. එසේ යම් වරදක් කරනු ලබන සෑම තැනැත්තකුටම එරෙහිව ඒ උපවගන්තියට අනුව මහෙස්ත්‍රාත් අධිකරණයේ චෝදනා පත්‍රයක් ගොනු කිරීමට ක්‍රියා කරනු ලබන බවත්, ඒ අනුව මහෙස්ත්‍රාත් අධිකරණය විසින් වරදකරුවකු කරනු ලැබූ විට රුපියල් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු බවත් වැඩි දුරටත් දන්වා සිටිමි.

එස්. ඒ. එස්. එම්. වික්‍රමසූරිය,
ලේකම්,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

***දේපළවල වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමට/ අක්කර බදු කාර්යය සඳහා දේපළ සනොක්ෂණය කිරීමට අවශ්‍ය වාර වාර්තාව***

.......................................... ප්‍රාදේශීය සභාව
(ආකෘතිය සම්පූර්ණ කිරීමට පෙර අවසානයේ ඇති උපදෙස් හොඳින් පිළිපදින්න)

01. දේපළෙහි අයිතිකරු/වන්ගේ සම්පූර්ණ නම/ නම් : (හවුල් අයිතියක් ඇති විට සෑම අයිතිකරුවකුගේ ම නම්)

*(අ)* .......................................................................................................

*(ආ)* .......................................................................................

*(ඇ)* .......................................................................................

*(ඈ)* ....................................................................................................

*(ඉ)* ....................................................................................................

02. දේපළෙහි අයිතිකරු/වන්ගේ ලිපින : (හවුල් අයිතියක් ඇති විට ඉහත අංක 01 හි අනුපිළිවෙල අනුව) ඃ

*(අ)* ..........................................................................................................
*(ආ)* ..........................................................................................................
*(ඇ)* ..........................................................................................................
*(ඈ)* ..........................................................................................................
*(ඉ)* ..........................................................................................................

03. අයිතිකරු/වන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය/ අංක : (හවුල් අයිතියක් ඇති විට ඉහත අංක 01 හි අනුපිළිවෙලට) ඃ

*(අ)* ..........................................................................................................
*(ආ)* ..........................................................................................................
*(ඇ)* ..........................................................................................................
*(ඈ)* ..........................................................................................................
*(ඉ)* ..........................................................................................................

04. ඉදිරි කටයුතුවල දී ප්‍රාදේශීය සභාව සමග ගනුදෙනු කිරීමේ පහසුව සඳහා විද්‍යුත් තැපැල් ලිපිනයක් තිබේනම්, අයිතිකරු/වන්ගේ විද්‍යුත් තැපැල් ලිපිනය/ ලිපින : (හවුල් අයිතියක් ඇති විට ඉහත අංක 01 හි අනුපිළිවෙල අනුව) ඃ

*(අ)* ..........................................................................................................
*(ආ)* ..........................................................................................................
*(ඇ)* ..........................................................................................................
*(ඈ)* ..........................................................................................................
*(ඉ)* ..........................................................................................................

05. අයිතිකරු හෝ අයිතිකරුවන් වෙනුවෙන් මේ ආකෘතිය සම්පූර්ණ කරනු ලබන්නේ ඇටෝර්නි බලය පැවරී ඇති යම් තැනැත්තකු හෝ තැනැත්තන් වන විට, ඇටෝර්නි බලකරු/කරුවන් පිළිබඳ විස්තරඃ

| | *අයිතිකරුගේ නම* | *ඇටෝර්නි බලකරුගේ* | |
|---|---|---|---|
| | | *නම* | *ජා.හැ.ප. අංකය* |
| *(අ)* | .................................... | .................................... | .................................... |
| *(ආ)* | .................................... | .................................... | .................................... |
| *(ඇ)* | .................................... | .................................... | .................................... |
| *(ඈ)* | .................................... | .................................... | .................................... |
| *(ඉ)* | .................................... | .................................... | .................................... |

06. *දේපළෙහි පිහිටීම* ඃ

*(අ)* ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය හා නම – අංකය :.................. නම :....................................
*(ආ)* ප්‍රාදේශීය සභා කොට්ඨාස අංකය සහ නම (දන්නේ නම්) :
අංකය :.................. නම :..................
*(ඇ)* පාර හෝ වීථිය :....................................

07. වරිපනම් හෝ අක්කර බදු අංකය (දැනටමත් අංකයක් දී ඇත්නම්) :..................

08. ඉඩමේ ප්‍රමාණය : අක්කර : ..................රූඩ් :..................පර්චස් :............... (හෙක්ටයාර්..................)

09. ඉඩමට මායිම් : ඉඩමේ ඔප්පුවේ සහ මිනින්දෝරු සැලැස්මේ දැක්වෙන මායිම් අනුව සටහන් කළ යුතු අතර, ඒ තොරතුරු සමග මේ විස්තර නිවැරදි විය යුතු ය ඃ

*උතුරට* : ..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

*නැගෙනහිරට* : ..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

*දකුණට :* ..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

*බස්නාහිරට :* ..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

10. අයිතිකරුට/අයිතිකරුවන්ට ඉඩම අයත් වූ ආකාරය :......................
(අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් දේපළට අදාළව (වසර 30 ක පූර්ව කාලයක් සඳහා) නිකුත් කළ පත් ඉරුවල මුල් පිටපත සහ සහතික කරන ලද පිටපත් අමුණන්න)

11. *(අ)* ඔප්පුවේ අංකය :.......................
*(ආ)* නොතාරිස්තැනගේ නම :................................................
*(ඇ)* ලියාපදිංචි කළ දිනය :.......................
(ඔප්පුවේ සහතික කරන ලද පිටපත් දෙකක් අමුණන්න)

12. ඉඩමේ මිනින්දෝරු සැලැස්ම පිළිබඳ විස්තර :
*(අ)* අංකය :.......................
*(ආ)* සැලසුමේ දිනය :.......................
*(ඇ)* මිනින්දෝරුතැනගේ නම :.......................
(මිනින්දෝරු සැලැස්මේ සහතික කරන ලද පිටපත් දෙකක් අමුණන්න - ප්‍රාදේශීය සභාවෙන් අනුමැතියක් ලබා ඇති අනුබෙදුම් සැලැස්මක් තිබෙන විට එහි සහතික පිටපත් අවශ්‍ය වේ.)
*(ඈ)* සැලැස්මේ පරිමාණය :.......................

13. ඉඩම තුළ ගොඩනැගිලි ඇත්නම් - (ප්‍රාදේශීය සභාවෙන් අනුමැතිය ලබා ඇති ගොඩනැගිලි සැලසුම් තිබේ නම්, ඒවායේ (පිටපතෙහි ප්‍රමාණයටම ලබාගත්) සහතික කළ පිටපත් දෙකක් අමුණන්න)
*(අ)* පවතින ගොඩනැගිලි සංඛ්‍යාව : ............ සහ *(ආ)* එක් එක් ගොඩනැගිල්ලේ විස්තර :

| *ගොඩනැගිලි අංකය* 1 | *ස්වභාවය* 2 | *භාවිත කරන කාර්යය* 3 |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

(ප්‍රධාන ගොඩනැගිල්ලට අංක 01 වශයෙන් යොදමින් ඉතිරි ගොඩනැගිලි එකින් එක අංක කර, 1 වැනි තීරුවේ ද, එක් එක් ගොඩනැගිල්ල තනි මහලකින් ද, දෙමහල් ද, තෙමහල් ද ආදී වශයෙන් 2 වැනි තීරුවේ ද, එක් එක් ගොඩනැගිල්ල භාවිත කරනු ලබන ආකාරය නේවාසික/වාණිජ/කර්මාන්ත ශාලා ද යනුවෙන් 3 වන තීරුවේ ද සටහන් කරන්න.)

14. ඉඩමේ හෝ ගොඩනැගිල්ල තුළ යන්ත්‍ර සූත්‍ර සවිකර ඇත්නම්, ඒ පිළිබඳ විස්තර :

| *යන්ත්‍ර සූත්‍ර වර්ගය* 1 | *මිලදී ගත් දිනය* 2 | *වටිනාකම* 3 |
|---|---|---|
| *අ.* | | |
| *ආ.* | | |
| *ඇ.* | | |
| *ඈ.* | | |
| *ඉ.* | | |

(1 වැනි තීරුවේ යන්ත්‍රය කුමක් ද යන්න ද, ඒ යන්ත්‍රය මිල දී ගත් දිනය 2 වැනි තීරුවේ ද, එක් එක් යන්ත්‍රය මිල දී ගත් දිනයේ වටිනාකම කොපමණ ද යන්න 3 වැනි තීරුවේ ද යන්න සටහන් කරන්න. ඒ සමගම ඒ එක් එක් යන්ත්‍ර සූත්‍ර පිළිබඳ විස්තරය, මිල දී ගත් දිනය සහ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක පිටපත් දෙකක් සහ මිල දී ගත් කුවිතාන්සිවල පිටපත් දෙක බැගින් මේ ආකෘතියට අමුණන්න)

15. ඉඩම තුළ වගාවක් පවතී නම් ඒ පිළිබඳ විස්තර ඃ

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

.................................................................................................................

16. දේපළ කුලියට හෝ බද්දට දී තිබේ නම්, කුලී නිවැසියා හෝ බදුකරුගේ :

(අ) නම :..........................................................................................

(ආ) ජාතික හැඳුනුම් පත්‍ර අංකය :.......................................................................................

(ඇ) තවදුරටත් ඉතිරි වී ඇති ගිවිසුම්ගත කාලය : අවුරුදු:......... මාස:.........දින:.........

17. ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ/ අපගේ දැනීමේ හා විශ්වාසයේ ආකාරයට නිවැරදි බවත්, මෙහි කිසිදු අසත්‍ය හෝ සාවද්‍ය තොරතුරු කිසිවක් ඇතුළත්කර නොමැති බවටත් සහතික කරමි/කරමු. මේ ලේඛනයේ ඇතුළත් කර ඇති තොරතුරු සහ අමුණා ඇති ලේඛන කිසිවක් අසත්‍ය හෝ සාවද්‍ය බව තහවුරු වුවහොත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ සඳහන් ආකාරයට වරදකට වරදකරු/වරදකරුවන් වන බවත්, වරදකරු/ වරදකරුවන් කරනු ලැබුවහොත් අධිකරණය විසින් නියම කරනු ලබන දඩයකට මම/අපි යටත් වන බවත් දනිමි./දනිමු.

දේපළෙහි අයිතිකරු/ අයිතිකරුවන් නැතහොත් ඇටෝර්නි බලකරු/බලකරුවන් වන මම;

| | නම/නම් | අත්සන/අත්සන් |
|---|---|---|
| (අ) | ........................................................ | ................................................ |
| (ආ) | ........................................................ | ................................................ |
| (ඇ) | ........................................................ | ................................................ |
| (ඈ) | ........................................................ | ................................................ |
| (ඉ) | ........................................................ | ................................................ |

දිනය : 20.....................

* අදාළ නොවන වචන කපා හරින්න.

06-28

## 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 හා 24 (2) වගන්තිය යටතේ කරන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ මහනුවර දිස්ත්‍රික්කයේ අකුරණ ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් මාර්ගය අකුරණ ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සලකුණු යොද ඇති මෙම මාර්ගය සම්බන්ධයෙන් අදාළ ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශවයක් විසින් යම් විරුද්ධතාවයක් පළකරනු ලබන්නේ නම් මෙම නිවේදනය නිකුත් කළ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා 24(2) වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරන ලෙස දැනුම් දෙනු ලැබේ.

ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

2017 මැයි මස,
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

### උපලේඛනය

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *දිග* | *පළල* | *මායිම්* |
|---|---|---|---|---|
| 01 | පොල්කොටුව මාවත | අඩි 492 | අඩි 06 | වම්පස :<br><br>ආයිසා පල්ලිය අසලින් ආරම්භ වී ජේ. එම්. ජිෆ්රි මයාගේ ඉඩමට, ජේ. කැමරුන් නිසා මයාගේ ඉඩමට, ඒ. ඒ. ආර්.බානු මයාගේ ඉඩමට, පී. එම්. නුමාන් මයාගේ ඉඩමට, සම්සුල් හිනායා මයාගේ ඉඩමට, පාතිමා සියානා මියගේ ඉඩමට, ෆවුසියා උම්මා මියගේ ඉඩමට, හජ්ජික් නිසා මයාගේ ඉඩමට, ජේ. ෆාතිමා ෆර්සානා මියගේ ඉඩමට, රම්සාන් බිබී මයාගේ ඉඩමට, එම්. ඩීත් මයාගේ ඉඩමට, ෆාතිමා ෆසීනා මියගේ ඉඩමට, ඉල්මුන් නිසා මයාගේ ඉඩමට, ෆාතිමා සෆිකා මියගේ ඉඩමට, එම්. පී. ඒ. මනාෆ් මයාගේ ඉඩමට අයත් වන මායිම් වේ.<br><br>දකුණු පස :<br><br>ආයිසා පල්ලිය අසලින් ආරම්භ වී කේ. එම්. ෆවුසර් මයාගේ ඉඩමට, එස්. නසීමා මියගේ ඉඩමට, කේ. මරිනා මියගේ ඉඩමට, එෆ්. රාමිලා මියගේ ඉඩමට, උම්මු රොජාන් මයාගේ ඉඩමට, එම්. ඒ. එම්. සියාම් මයාගේ ඉඩමට, කේ. එස්. මසීන් මයාගේ ඉඩමට, කේ. එම්. ෆයිසල් මයාගේ ඉඩමට, ඒ. එච්. එම්. ෆාරුක් මයාගේ ඉඩමට, එම්. එෆ්. එම්. අස්ලම් මයාගේ ඉඩමට , එම්. එස්. මුසම්මිලා මියගේ ඉඩමට, ෆාතිමා අස්මිලා මියගේ ඉඩමට එම්. එම්. අයාස් මයාගේ ඉඩමට, කේ. ජාරියා උම්මා මයාගේ ඉඩමට අයත්වන මායිම් වේ. |

06-76

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

### ගෝ ඝාතකාගාරයක් පිහිටුවීම සඳහා විරෝධතා කැඳවීම

උඳුගොඩ, පහලයටිදූරිය පදිංචි එම්. එස්. ඒ. කප්පාර් විසින් ගෝණාරඹ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කන්නත්තොට ග්‍රාමයේ අරඹේගේ වත්ත නමැති ඉඩමේ ගෝ ඝාතකාගාරයක් පිහිටුවීම සම්බන්ධයෙන් ගෝ ඝාතක ආඥපනතේ අංක 07 වගන්තිය යටතේ රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ පුරවැසියන්ගෙන් විරෝධතා කැඳවනු ලැබේ. මේ සම්බන්ධයෙන් ඔබගේ විරෝධතාවයක් ඇත්නම් එසේ විරුද්ධ වන්නට තිබෙන කරුණු පිළිබඳ ලිඛිත ප්‍රකාශනයක් පිටපත් 02 කින් යුක්තව වෙන වෙනම ලියුම් කවරවල බහා "ලේකම්, ප්‍රාදේශීය සභාව, රුවන්වැල්ල" යන ලිපිනයට මෙදින සිට දින 30 ක් ඇතුළත ගෙනැවිත් භාර දීම හෝ ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතු ය.

ටී. එල්. කේ. ඩී. ලේකම්ගේ,<br>
ලේකම් (වැඩ බලන),<br>
ප්‍රාදේශීය සභාව,<br>
රුවන්වැල්ල.

2017 ජුනි මස 02 වැනි දින,<br>
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ දී ය.

06-153

---

## හබරාදූව ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර හබරාදූව ප්‍රාදේශීය සභා ලේකම් වන මා හට එම පනතේ 9(3) වගන්තියෙන් ලැබී ඇති බලතල පරිදි මා විසින් 2017.04.04 දින තීරණ අංක 50 යටතේ මෙහි දී පහත සඳහන් තීරණය ගෙන ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. ඩී. ද සී. දසනායක,<br>
ලේකම්,<br>
හබරාදූව ප්‍රාදේශීය සභාව.

2017 අප්‍රේල් මස 27 වැනි දින.

### තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, හබරාදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වරිපනම් කාර්යය සඳහා යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙවත්තක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා සහ හෝ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගාකළ ඉඩමක විශාලත්වය තක්සේරු කිරීම සඳහා ද, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කෙරෙන සංවර්ධන කාර්යයන් සැළසුම් කිරීම පහසු කිරීමක් සහ 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 03 වන සහ 05 වන වගන්තිවල කාර්යය සඳහා තොරතුරු පද්ධතියක් නිර්මාණය කරගැනීම සඳහා ද එකී යම් දේපළක අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුලිය හෝ වාර්ෂික වටිනාකම හෝ එකී විශාලත්වය සහ වෙනත් කරුණු පිළිබඳ වාර වාර්තා සැපයීම නියම කිරීමට, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා හට පැවරී ඇති බලතල පරිදි තීරණය කරන ලදී.

06-145

**පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

අයගම ප්‍රාදේශීය සභාව

261 අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර අයගම ප්‍රාදේශීය සභාව විසින් 2017.01.30 වැනි දින තීරණ අංක 194 පරිදි අයගම ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් පහත තීරණය ගත් බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජී. ඩබ්ලිව්. ඥානවතී,
ලේකම්,
ප්‍රාදේශීය සභාව, අයගම.

2017 මැයි මස 17 වැනි දින,
අයගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සාදනු ලැබූ හා 1988.08.23 දිනැති සහ අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* (ආ) වන කොටසේ නිවේදනය කර සබරගමුව පළාත් සභාව විසින් 1990.08.16 දින කියවා සම්මත කර 1990.12.27 දින අංක 642/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* (අ) වන කොටසේ පළකරන ලද්ද වූ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා අයගම ප්‍රාදේශීය සභා ලේකම් විසින් 2017.01.30 දින තීරණ අංක 194 යටතේ තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

06-94

---

# විවිධ දැන්වීම්

සංශෝධනයයි

**පාලින්දනුවර ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂය සඳහා ජල ගාස්තු පැනවීම

පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ ලේකම්, කේ. ඒ. ඩී. එස්. එස්. කුඹලාතර වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 108 වැනි වගන්තිය හා 109 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පාලින්දනුවර ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන පානීය ජල ව්‍යාපෘතියේ ගාස්තු සංශෝධනය කොට 2017 වර්ෂය සඳහා පහත උපලේඛනයේ සඳහන් පරිදි අය කිරීමට තීරණය කරමි.

ලේකම්,
කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
පාලින්දනුවර ප්‍රාදේශීය සභාව.

*ස්ථාවර ගාස්තු -*

ගෘහස්ත - රු. 50.00 ව්‍යාපාරික - රු. 100.00

*ජල ගාස්තු -*

| | | | |
|---|---|---|---|
| ගෘහස්ත ඒකක | 1-10 | = | රු. 05.00 |
| | 11-20 | = | රු. 07.00 |
| | 21-30 | = | රු. 10.00 |
| | 31-50 | = | රු. 15.00 |
| | 50-80 | = | රු. 20.00 |
| ව්‍යාපාරික ඒකක | 1-10 | = | රු. 10.00 |
| | 11.20 | = | රු. 15.00 |
| | 21.30 | = | රු. 20.00 |
| | 31-50 | = | රු. 25.00 |
| | 50-80 | = | රු. 30.00 |

80 ඉහළ සියලු ඒකක සඳහා රු. 40.00

සම්බන්ධතා ගාස්තු = 8,000.00

අපද්‍රව්‍ය ජල පරිහරණ ගාස්තු = 8,000.00

විසන්ධි කරන ලද සම්බන්ධතාවයක් නැවත ලබා දීමේ දී ගාස්තු = රු. 500.00

06-146

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | ...137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. ගැසට් පත්‍රය නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ...... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2017** | | | |
| **ජුනි** | 2017.06.02 | සිකුරාදා | 2017.05.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.06.09 | සිකුරාදා | 2017.05.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.06.16 | සිකුරාදා | 2017.06.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.06.23 | සිකුරාදා | 2017.06.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.06.30 | සිකුරාදා | 2017.06.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජූලි** | 2017.07.07 | සිකුරාදා | 2017.06.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.07.14 | සිකුරාදා | 2017.06.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.07.21 | සිකුරාදා | 2017.07.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.07.28 | සිකුරාදා | 2017.07.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2017.08.04 | සිකුරාදා | 2017.07.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.08.11 | සිකුරාදා | 2017.07.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.08.18 | සිකුරාදා | 2017.08.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.08.25 | සිකුරාදා | 2017.08.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.08.31 | බ්‍රහස්පතින්දා | 2017.08.18 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.